පර්යේෂණ ක්ෂේත්‍රයේ 81 වසරක අභිමානය
81 வருட ஆய்வின் சாதனை
81 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
SALUS UNITAS NOSTRA
INCORPORATED 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391 - 6785
සය වන කාණ්ඩය, පළවන කලාපය 2006 ජනවාරි - ජූනි

## නියමිත පොහොර මාත්‍රාව නිවැරදි වේලාවට ලබා දී අත මිට සරු කර ගනිමු

ඕනෑම වගාවක අස්වැන්න සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ පසේ සාරවත් භාවයයි. මෙය පසක භෞතික, රසායනික සහ ජෛව ගුණාංග වල සංකලනයක් ලෙස විග්‍රහ කල හැක. එමෙන්ම යම් පසක සශ්‍රීකත්වය නිර්ණය කිර්ම සඳහා පසේ ඇති කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය, පසේ පී.එච් අගය (ආම්ලිකතාවය) සහ පෝෂක ප්‍රතිශතය, උපයෝගී කර ගත හැක.

වර්ෂ 1934 දී ආචාර්ය ටී ඊඩින් මහතා විසින් තලවාකැලේ තේ පර්යේෂණායතනයේදී බහු වාර්ෂික වගාවක් සඳහා ප්‍රථම වරට සැලසුම් සහගත විද්‍යාත්මක පොහොර ක්ෂේත්‍ර පරීක්ෂණයක් ආරම්භ කරනු ලැබිණි. එදා මෙදා තුර තේ පර්යේෂණායතනය විසින් සිදු කරන ලද පරීක්ෂණ වලට අනුකූලව තේ වගා ක්ෂේත්‍රයේ පුනරුත්තාපනයේ සිට කප්පාදු චක්‍රය දක්වා විවිධ පොහොර මිශ්‍රණ හඳුන්වා දී තිබේ.

තේ ගසක වර්ධනය සඳහා අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අධි මාත්‍ර පෝෂක සහ අංශු මාත්‍ර පෝෂක ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

අධි මාත්‍ර පෝෂක අතර කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන්, නයිට්‍රජන්, පොස්පරස්, කැල්සියම්, මැග්නීසියම් සහ සල්ෆර් ප්‍රධාන තැනක් ගනියි. මේවා තේ ශාකයේ වර්ධනය සඳහා විශාල මාත්‍රාවක් ලබා දිය යුතු අතර ඒවා අතරින් නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් ප්‍රධාන කාර්යයක් ඉටු කරයි.

අංශු මාත්‍ර පෝෂක අතර සින්ක්, බෝරෝන්, යකඩ, මැන්ගනීස් කොපර් සහ ක්ලෝරීන් වැදගත් වේ. නමුත් මේවා තේ ශාකයේ වර්ධනය සඳහා අවශ්‍ය වන්නේ ඉතා අල්ප මාත්‍ර වලිනි. මෙම පෝෂක අතරින් සින්ක් ප්‍රධාන තැනක් ගනියි.

තේ ගසට අවශ්‍ය පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණයන් ගසේ වර්ධන අවධිය අනුව වෙනස් වේ. එම නිසා පොහොර භාවිත කිරීමේදී උපරිම ප්‍රථිපල ලැබීමට නම් පොහොර වර්ගය, යොදන ප්‍රමාණය, යොදන අවධිය, කාලය, වාර ගණන සහ යොදන ක්‍රමය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.

පොහොර යොදන විට කල්පනාකාරී විය යුතු වැදගත්ම කරුණ නම් යොදන කාලයයි. තදින් පායන හෝ අධික ලෙස වර්ෂාව ඇති කාල වලදී පොහොර යෙදීම නොකල යුතුය. පායන කාලයේදී වාෂ්පීකරණය සහ පසට උරා ගැනීම අඩුවීම මෙන්ම, අධික ලෙස වර්ෂාව ඇති කාල වලදී සිදු වන සෝදා පාළුව සහ පසේ ගැඹුරට කාන්දු වීම නිසාද පොහොර නියමිත පරිදි ශාකයට ලබා ගත නොහැක. පොහොර යෙදීමට සුදුසුම කාලය නම් මතු පිට පසෙහි තෙතමනය ඇති මද වැසි දවස්ය. එමෙන්ම කප්පාදුවට මාස 2-3 කට පෙරද කප්පාදුවෙන් පසු මාස 3 කට කලින්ද පොහොර යෙදීම නොකල යුතුය. තවද, පොහොර යොදන අවස්ථාවේ පසේ පී.එච් අගය මෙන්ම පසේ ඇති කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පිලිබඳ සැලකිලිමත් විය යුතුය. මක් නිසාද යත් පසේ පී.එච් අගය සහ කාබනික ද්‍රව්‍ය මත යොදන පොහොර ප්‍රමාණය අවශෝෂණය වීම රඳා පවතින නිසාය.

තේ වගාවක් සඳහා පොහොර යොදන ප්‍රමාණය තීරණය වන්නේ වගාවෙන් ලැබෙන වාර්ෂික අස්වනු විභවය මතය. ඔබ ලබා ගන්නා අස්වැන්න මාසිකව දළු පොතෙහි නිසියාකාරව සඳහන් කර ගනිමින් ඒ අනුව ඔබේ වගාවට යෙදිය යුතු නියමිත පොහොර ප්‍රමාණ යෙදීමෙන් උපරිම ප්‍රතිඵල ලබා ගත හැක.

උදාහරණයක් ලෙස පහතරට මේරූ තේ වගාවක් සඳහා VPLC/880 මිශ්‍රණය අස්වනු විභවය අනුව යෙදිය යුතු ආකාරය සලකා බලමු. මෙහි ඇති පෝෂක සංයුතිය නම් N 30.7%, $P_2O_5$ 4.1% සහ $K_2O$ 11.4% කි. ඒ අනුව වෙළඳ පොලේ ඇති අමිශ්‍ර පොහොර භාවිතා කොට මිශ්‍ර පොහොර කි. ග්‍රෑ. 50 ඔබේ ගෙවත්තේදීම පහත පරිදි සාදා ගත හැක.

| | |
|---|---|
| යූරියා | කි.ග්‍රෑ.33.5 |
| එප්පාවලරොක්පොස්පේට් | කි.ග්‍රෑ. 7.0 |
| මියුරේට් ඔෆ් පොටෑෂ් | කි.ග්‍රෑ 9.5 |
| මුළු | කි.ග්‍රෑ. 50.0 |

දැන් ඔබට ඉහත ආකාරයට තේ අක්කරයකින් ලැබෙන අස්වනු විභවය අනුව පහත වගුවේ සඳහන් පරිදි ඔබට අවශ්‍ය පොහොර ප්‍රමාණය පිළියෙල කර ගත හැක.

කෙසේ නමුත් ඔබගේ තේ වගාව සඳහා පොහොර යෙදිය යුතු වාර ගණන සහ වසරකට යෙදිය යුතු ප්‍රමාණ ඔබගේ ප්‍රදේශයේ වර්ෂාපතන ව්‍යාප්තිය අනුව ඔබට තීරණය කල හැක. මක් නිසාද යත් ඔබගේ පළාතේ වර්ෂාපතනය අනුව අස්වැන්න තීරණය වන බැවිනි.

ඉහත විස්තර කළ ආකාරයට, ඔබගේ ක්ෂේත්‍රයේ ඇති පස්වල සශ්‍රීකත්වය ගැන සැලකිලිමත් වන්නේ නම් සහ තේ පර්යේෂණායතනය මගින් නිර්දේශිත විවිධ පොහොර මිශ්‍රණ අවශ්‍ය මාත්‍රාව නිවැරදි ලෙස ලබා දෙන්නේ නම් ඔබට මෙන්ම ඔබගෙන් යැපෙන්නන්ටද සැපවත් ජීවිතයක් ගත කර ගැනීමට ඔබගේ අත මිට සරු කර ගත හැක.

| අස්වැන්න වසරකට අමුදළු කි.ග්‍රෑ | වී.පී.එල්.සී 880 මිශ්‍රණයෙන් යෙදිය යුතු ප්‍රමාණය කි.ග්‍රෑ | එක් වරක් සඳහා අවශ්‍ය පොහොර මිශ්‍රණය සාදා ගැනීමට ගත යුතු අමිශ්‍ර පොහොර ප්‍රමාණය කි.ග්‍රෑ | | | අමතරව යෙදිය යුතු යූරියා ප්‍රමාණය කි.ග්‍රෑ |
|---|---|---|---|---|---|
| | | යූරියා | එප්පාවල රොක් පොස්ෆේට් | මියුරේට් ඔෆ් පොටෑෂ් | |
| 3000-3400 | 85 බැගින් 3 න් වරක් | 57 | 12 | 16 | අවශ්‍ය නැත |
| 3400-3600 | 95 බැගින් 3 න් වරක් | 64 | 13 | 18 | අවශ්‍ය නැත |
| 3600-4500 | 120 බැගින් 3 න් වරක් | 80 | 17 | 23 | අවශ්‍ය නැත |
| 4500-5400 | 120 බැගින් 3 න් වරක් | 80 | 17 | 23 | 45 බැගින් එක් වරක් |
| 5400-6300 | 120 බැගින් 3 න් වරක් | 80 | 17 | 23 | 80 බැගින් එක් වරක් |
| 6300 ට වැඩි | 120 බැගින් 3 න් වරක් | 80 | 17 | 23 | 55 බැගින් දෙවරක් |

හැරන් ජයවීර